

## මහරගම ධර්මායතනයේ බුද්ධ ප්‍රතිමා වහන්සේ

### ⁂ කරුණා – මෛත්‍රී බලයෙන් සතුරන් දමනය කළ බුදු හිමි

– නිර්මලා අමරසිංහ

බුදුරදුන්ගේ උත්තරීතර අධ්‍යාත්මික බලය ප්‍රකට වූ අවස්ථා. අන්‍ය දර්ශනවාදීන්ගේ සහ උන්වහන්සේගේ පෞරුෂය නිසා තමන්ගේ තැන රැකගැනීමට අපොහොසත් වූ විවිධ පුද්ගලයන්ගේ දුෂ්ට උපක්‍රම හමුවේ උන්වහන්සේගේ සුවිශේෂ ගුණ බලය හෙළිදරව් වූ අයුරු.

### ⁂ සදහම් දැනුම

බුදු දහම හා ඒ ආශ්‍රිත විවිධ විෂය කරුණු පිළිබඳ පාඨකයා දැනුවත්කරන – කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් විශේෂාංගයකි. දහම හදාරන සිසුන්ට විශේෂයෙන් ප්‍රයෝජනවත්ය.

### ⁂ සමාජ ප්‍රශ්න නිරාකරණයට බොදු පිළිවෙත් ආලෝකයකි.

– චිත්‍රා ලොකුගේ

බෞද්ධ ප්‍රතිපද මාර්ගය – විවිධ සමාජ ගැටලු නිරාකරණයට උපස්ථම්භක වන අයුරු. සමාජ – ආර්ථික – මානසික ආදී වූ විවිධ ගැටලු විසඳ ගැනීම සඳහා බුදු දහමෙන් ලැබෙන විචිත්‍ර මඟ පෙන්වීම.

### ⁂ සංස්කෘතික අගයක් පෙන්වන පන්සිය පනස් ජාතක පොතේ ධර්ම දේශනා චාරිත්‍ර විධි.

– හේරත්ගම ශ්‍රී ධම්මාරාම නාහිමි.

පන්සිය පනස් ජාතක පොතේ දැක්වෙන සුවිශේෂ දේශනා ශෛලියෙහි දක්නට ලැබෙන සංස්කෘතිකමය අගය. සදාචාරවත් සමාජයක් ගොඩ නැඟීමටත් – විවිධ ජීවන ගැටලු නිරාකරණය කර ගැනීමටත් – ජාතක සාහිත්‍යයෙන් ලැබෙන අද්විතීය පිටුබලය.

### ⁂ Nandivisala Jatakaya

**- by Dr. S. G. Samarasinghe**

### ⁂ පරාභව සූත්‍රය පෙන්වා දෙන පිරිහීමේ දොරටු

– ගම්පොළ ඤාණසීහ හිමි

ලෞකික මෙන්ම අධ්‍යාත්මික දියුණුවට හා පරිහානියට හේතු වන කරුණු පිළිබඳ පරාභව සූත්‍රයෙන් ලැබිය හැකි සුබාවබෝධය. විශේෂයෙන් ඉක්මන් දියුණුවක් පතන නූතන ගිහි සමාජයට ඒ තුළින් ලද හැකි වැදගත් මඟ පෙන්වීම.

### ⁂ ධම්මානු පස්සනා භාවනාව

– මහාචාර්ය උතුරාවල ධම්මරතන හිමි

බුදු දහමේ දැක්වෙන ‘සතර සතිපට්ඨාන’ නම් වූ සුවිශේෂ විදර්ශනා භාවනා ප්‍රවේශ හතරෙන් එකක් වූ “ධම්මානුපස්සනා’ භාවනාව පිළිබඳ විමර්ශනයකි. සිත පිළිබඳ විවිධ ධර්මතා ගැඹුරින් අවබෝධ කරගැනීම තුළින් විමුක්තිය උදාකර ගැනීමට උපකාර වන භාවනාවක් ලෙසයි, මෙය දහමෙහි දැක්වෙන්නේ.

### ⁂ ධර්මයෙහි සුරක්ෂිත භාවයට බුදුරදුන්ගෙන් ලද අනුබලය

– පින්වත්තේ අනුරුද්ධ හිමි

තමන්වහන්සේ ලොවට දේශනා කළ ධර්මය ලොව තුළ දිගු කලක් පැවැතීම සඳහා බුදුරදුන් අනුගමනය කළ සුවිශේෂ ප්‍රතිපත්ති. ධර්මයෙහි ස්ථාවරභාවය සඳහා බුදුරදුන් තම ශ්‍රාවකයන් වෙත අනුදැන වදාළ වැදගත් ප්‍රතිපත්ති.

### ⁂ පටිච්ච සමුප්පාදය, නූතන විද්‍යාව හා නිර්වාණය.

– පිටිදූවේ සිරිධම්ම හිමි

බෞද්ධ දර්ශනයේ එන ඉතාම සුවිශේෂ වූ ඉගැන්වීම වන හේතු = ඵල ක්‍රමය පිළිබඳ නූතන විද්‍යාව සමග සිදුකැරෙන තුලනාත්මක අධ්‍යයනයකි. ලෝකයේ පැවැත්ම සිදු වන හේතු – ඵල පිළිවෙළෙහි හා නිර්වාණයෙහි ස්වභාවය; විද්‍යාවෙහි ඉගැන්වෙන සාපේක්ෂතා වාදය හා සසඳ බැලීමක් හැටියට මෙම ලිපිය හැඳින්විය හැකිය.

## බලබෝව ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාරස්ථානය.

– ඩී. ඩබ්ලිව්. චන්ද්‍රසේකර

ගම්පහ දිස්ත්‍රික්කයේ බලබෝව නම් වූ සුන්දර ගම් පියසෙහි පිහිටි වසර එකසිය පනහක් පමණ පැරැණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු පැවසෙන ලිපියකි.

## බුදු ගල්ලෙන අරණ

– ජනක වෙත්තසිංහ

රහතන් වහන්සේ පවා වැඩ සිටි බව සැලකෙන – ඓතිහාසික ශාස–නික වැදගත්කමක් ඇති ඉපැරණි සුප්‍රකට ආරණ්‍ය සේනාසනයක් පිළිබඳ තොරතුරු ය, මෙවර ‘සිත සනසන සෙනසුන’ විශේෂාංගයෙන් ඉදිරිපත් වන්නේ.

## කසළ ගොඩෙන් මතු වන සුවඳවත් මිනිසා

– දිවියාගහ යසස්සි නාහිමි

ජීවිතය පිළිබඳ අනවබෝධයෙන් පිරුණු – දූෂිත සමාජයක්තුළ ධර්–මාවබෝධය නිසා පුද්ගලයකු සුවඳවත් කුසුමක් මෙන් බැබැළෙන අයුරු ‘සාර්ථක ජීවිතයකට ධම්ම පදයෙන්’ විශේෂාංගය යටතේ පළ වන කුඩා ලිපියකි.

## අත්තුඩාවේ සිරි රාහුල මහ නා හිමි

රුහුණු විශ්ව විද්‍යාලයේ කුලපති ධූරය හොබවන අස්ගිරි මහා විහාර පාර්ශ්වයෙන් ගෞරව උපහාර ලද ප්‍රකට විද්වත් හිමිනමක් පිළිබඳ විස්තර මෙම ලිපියෙහි ඇතුළත් වේ.

## බොදු සිරිත් විරිත් අගයන බක්මහ උළෙල

– කතුවැකිය

## Buddha brings peace to Nagadipa (Jaffna)

**- by Danister I. Fernando**